තනතුරු - ඇබෑර්තු

අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

බාහිර උපදේශක තනතුර සඳහා සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම - 2027 අධ්‍යයන වර්ෂය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් 2027 අධ්‍යයන වර්ෂය තුළ ආරම්භ කිරීමට අපේක්ෂිත වෘත්තීය පාඨමාලාවල අධ්‍යයන කටයුතු සඳහා බාහිර උපදේශක තනතුරට බාහිර සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම සඳහා මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති නිර්ණායක / කාර්මික විද්‍යාලවල අධ්‍යක්ෂවරුන් / විදුහල්පතිවරුන් විසින් **මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම්පත්** කැඳවනු ලැබේ. ඊට අදාළ අයදුම්පත් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය **WWW.dtet.lk** **වෙත පිවිසීමෙන් සම්පත්දායක සංචිතය සඳහා මාර්ගගත ක්‍රමයට අයදුම්පත් යොමු කළ හැකිය. අයදුම්පත් භාර ගැනීම 2026.12.07 දිනෙන් අවසන් වේ.**

02. බාහිර උපදේශකයින් ලෙස බඳවා ගැනීමට තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-

I. බාහිර උපදේශකයින් ලෙස බඳවා ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම්වලට අනුව සිදු කරනු ලැබේ. ඒ අනුව සියළුම අපේක්ෂකයින් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ඒ ඒ පාඨමාලාවලට අදාළ ක්ෂේත්‍රයේ තම අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් පහත පරිදි සම්පූර්ණ කර තිබිය යුතු ය.

II. NVQ 3 / 4 මට්ටමේ පාඨමාලාවල ඉගැන්වීම් හෝ පුහුණු කිරීම් සඳහා අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(a) විෂය ක්ෂේත්‍රයට අදාළ NCT හෝ NVQ -5 මට්ටම හෝ NVQ -5 මට්ටමට සමාන විෂය ක්ෂේත්‍රයට අදාළව රජය පිළිගත් වෙනත් සහතිකයක් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද

(b) විෂය ක්ෂේත්‍රයට අදාළ NVQ – 6 මට්ටමට සමාන සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද (උදා:- HNDE /NDT / NDES වැනි අදාළ ක්ෂේත්‍රයේ රජය පිළිගත් වෙනත් සුදුසුකම්)

(c) අදාළ ක්ෂේත්‍රයේ උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් හෝ සම මට්ටමේ වෘත්තීමය සුදුසුකම සමඟ අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද

III. NVQ 5 මට්ටමේ පාඨමාලාවල ඉගැන්වීම් හෝ පුහුණු කිරීම් සඳහා අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

(a) විෂය ක්ෂේත්‍රයට අදාළ NVQ – 5 මට්ටම හෝ NVQ – 5 මට්ටමට සමාන විෂය ක්ෂේත්‍රයට අදාළව රජය පිළිගත් වෙනත් සහතිකයක් සමග අදාළ විෂය ඉගැන්වීමේ හෝ අදාළ කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද හෝ NCT සමග වසර 10 ක ඉගැන්වීමේ හෝ අදාළ කර්මාන්තයේ පළපුරුද්ද (පළමු සමාසිකයේ (ප්‍රථම වසර) හා දෙවන සමාසිකයේ (දෙවන වසර) ඉගැන්වීම් කටයුතු සඳහා පමණි.)

(b) විෂය ක්ෂේත්‍රයට අදාළව NVQ – 6 මට්ටමට සමාන සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද (උදා:- HNDE /NDT / NDES වැනි අදාළ ක්ෂේත්‍රයේ රජය පිළිගත් වෙනත් සුදුසුකම්)

(c) අදාළ ක්ෂේත්‍රයේ උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් හෝ සමාන මට්ටමේ වෘත්තීමය සුදුසුකම සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද

(d) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි / ආචාර්ය උපාධි සුදුසුකම් හෝ සමාන වෘත්තීය සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද

IV. NVQ 6 මට්ටමේ පාඨමාලාවල ඉගැන්වීම් හෝ පුහුණු කිරීම් සඳහා අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

(a) අදාළ ක්ෂේත්‍රයේ උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන වෘත්තීමය සුදුසුකම සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද

(b) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි / ආචාර්ය උපාධි සුදුසුකම් හෝ සමාන වෘත්තීය සුදුසුකම් සමග අදාළ විෂය ඉගැන්වීමේ / කර්මාන්තයේ අවම වසර 3ක පළපුරුද්ද

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

03. ගාස්තු ගෙවීම :-

බාහිර සම්පත්දායකයින් හට ගෙවන ගාස්තුව ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද, පාඨමාලාවේ NVQ මට්ටම් අනුව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ බාහිර උපදේශක ගෙවීම් චක්‍රලේඛවලට අනුව සිදු කෙරේ.

04. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-

රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් තම අයදුම් පත්‍රය මාර්ගගතව ඉදිරිපත් කළ පසු එහි පිටපතක් භාගත කර, බාහිර සම්පත්දායකයෙකු ලෙස තෝරා ගතහොත් තාක්ෂණ / කාර්මික විද්‍යාලයක බාහිර උපදේශකවරයෙකු ලෙස සේවයේ යෙදීම නිසා සිය රාජකාරී කටයුතුවලට බාධාවක් නොවන බවට ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත අයදුම් පත්‍රයේ පිටපත ඉදිරිපත් කළ යුතුය.

05. තෝරා ගැනීම :-

(a.) තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාව මත 2027 වර්ෂය සඳහා බාහිර සම්පත්දායකයින් බඳවා ගනු ලැබේ. එසේම විෂයයන් ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින්ට තෝරා ගැනීමේ දී ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයෙකුගේ බාහිර උපදේශක පත්වීම එම තැනැත්තා / තැනැත්තිය නීතියෙන් වරදකරුවෙකු වූ තැනැත්තකු වුවහොත් / ඉදිරිපත්කර ඇති අධ්‍යාපන හා වෘත්තීය සහතික ව්‍යාජ බවට තහවුරු වුවහොත් / සමාජ විරෝධී ක්‍රියවන්වල නිරත තැනැත්තෙකු බවට තහවුරු වුවහොත් / ඉගැන්වීම් සම්බන්ධයෙන් සෑහීමට පත් විය නොහැකි ලෙස ශිෂ්‍ය පැමිණිලි ඉදිරිපත් වුවහොත් විද්‍යාලයේ අවශ්‍යතාව අනුව ලිඛිතව නිසි හේතු දැක්වීමකින් පසුව ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට අධ්‍යක්ෂ / විදුහල්පතිට හැකි බව ද සැලකිය යුතු වේ.

(b.) මූලික අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කළ වයස අවු 65 ට අඩු පුද්ගලයින් බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම්කර නැති අවස්ථාවල දී පමණක් වයස අවු 65 වැඩි අයදුම් කරුවන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(c.) බාහිර සම්පත්දායකයින් ලෙස අයදුම්කර ඇති අයදුම්කරුවන් අතර පෙර වසරක අප තාක්ෂණ / කාර්මික විද්‍යාලයක බාහිර උපදේශකවරයෙකු /උපදේශකවරියක ලෙස සේවය කර, දෙපාර්තමේන්තුවේ හෝ විද්‍යාලයේ කීර්තිනාමයට හානියක් වන ආකාරයේ විනය විරෝධී ක්‍රියාවක නිරතව ඇති පුද්ගලයින් සිටී නම් එම පුද්ගලයින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමකින් තොරව අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ.

(d.) බාහිර සම්පත්දායකයින් ලෙස ලියාපදිංචි වන උපදේශකයින් තමන් ඉගැන්වීම් සිදු කරන තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ සියළුම විභාග කටයුතු සඳහා එනම් පාඨමාලා අවසාන / වර්ෂ අවසාන / සමාසික විභාග සඳහා අවශ්‍ය ප්‍රශ්න පත්‍ර සැකසීම, විභාග කටයුතු පැවැත්වීම, උත්තර පත්‍ර පරීක්ෂාව ආදී කටයුතු විශේෂ ගෙවීමක් සහිතව හෝ රහිතව සිදුකිරීම අනිවාර්යය වේ.

06. මෙම බාහිර උපදේශක ලියාපදිංචිය 2027 අධ්‍යයන වර්ෂය සඳහා පමණක් වන අතර, කිසිදු ස්ථිර තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නැත.

07. බාහිර උපදේශකවරුන් බඳවා ගැනීමට විද්‍යාලවල පවතින පුරප්පාඩු ප්‍රමාණයට ඉල්ලුම් පත්‍ර යොමු කර නොමැති අවස්ථාවල දී සහ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් අයදුම්කර නොමැති අවස්ථාවලදී මෙන්ම වසර මැද යම් පාඨමාලාවක උපදේශක පුරප්පාඩු ඇති වුවහොත් නැවත මාර්ගගතව අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා බාහිර උපදේශකවරුන් බඳවා ගැනීමට විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත බලය පැවැරී ඇත.

08. සිංහල, ඉංග්‍රීසි, දෙමළ *ගැසට් පත්‍ර* අතර වෙනසක් ඇතොත් සිංහල ගැසට් පත්‍රය බලාත්මක වේ.

ඩී. වත්සලා මාරඹගේ,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ
දෙපාර්තමේන්තුව.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ 10.
www.dtet.gov.lk

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

තාක්ෂණ / කාර්මික විද්‍යාල ලැයිස්තුව

අනු. අංකය	*තාක්ෂණ / කාර්මික විද්‍යාලය*	*ලිපිනය*	*දූරකථන අංකය*	*දිස්ත්‍රික්කය*
01	අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය	ඉහිනියාගල පාර, අම්පාර.	063-2223485 063-2224236	අම්පාර
02	අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය	විද්‍යාල මාවත, අනුරාධපුරය.	025-2222690 025-2224710	අනුරාධපුරය
03	බදුල්ල තාක්ෂණ විද්‍යාලය	ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුලුපිටිය,බදුල්ල.	055-2222413 055-2230550 055-2220413	බදුල්ල
04	ගාල්ල තාක්ෂණ විද්‍යාලය	කළුවැල්ල, ගාල්ල.	091-2234051 091-2225985	ගාල්ල
05	යාපනය තාක්ෂණ විද්‍යාලය	බ්‍රවුන්ස් පාර, යාපනය.	021-2220028 021-2212403	යාපනය
06	මහනුවර තාක්ෂණ විද්‍යාලය	අරුප්පල, මහනුවර.	081-2224063 081-2211810	මහනුවර
07	කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය	පුත්තලම පාර, කුරුණෑගල.	037-2223264 037-2056069	කුරුණෑගල
08	ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය මරදාන	ඕල්කොට් මාවත, කොළඹ 10.	011-2440352 011-2324177	කොළඹ
09	රත්නපුර තාක්ෂණ විද්‍යාලය	ෆාම් ගාර්ඩන්, කොළඹ පාර, රත්නපුරය.	045-2232390 045-2224715	රත්නපුර
10	අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය	ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව.	067-2279326 067-2279865	අම්පාර
11	ආණමඩුව කාර්මික විද්‍යාලය	නවගත්තේගම පාර, ආණමඩුව.	032-2263288 032-2263299 032-2263163	පුත්තලම
12	බලපිටිය කාර්මික විද්‍යාලය	දුම්රියපොළ පාර, වඳදූව, බලපිටිය.	091-2258096 091-2255248	ගාල්ල
13	බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය	වැවතැන්න, බණ්ඩාරවෙල.	057-2222753 057-2233754	බදුල්ල
14	මඩකලපුව කාර්මික විද්‍යාලය	ප්‍රධාන පාර, මන්චන්තොඩුවායි, මඩකලපුව.	065-2246557 065-2248366 065-2248727	මඩකලපුව
15	බෙලිඅත්ත කාර්මික විද්‍යාලය	පුවක්දණ්ඩාව, බෙලිඅත්ත.	047-2243229 047-2251255	හම්බන්තොට
16	දඹුල්ල කාර්මික විද්‍යාලය	මාතලේ පාර, දඹුල්ල.	066-2284713 066-2284885	මාතලේ
17	දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය	මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය.	027-2250117 027-2250262	අම්පාර
18	ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය	නෝනාගම පාර, ඇඹිලිපිටිය.	047-2261037 047-2261608	රත්නපුර
19	ගම්පහ කාර්මික විද්‍යාලය	වැරැල්ලවත්ත, යක්කල.	033-2229711 033-2222132 033-2233253	ගම්පහ
20	හසලක කාර්මික විද්‍යාලය	යෝධ ඇල පාර, හසලක.	055-2257129 055-2258950	මහනුවර

Gazette.lk AMBITIONS REALIZED

අනු. අංකය	නාක්ෂණ / කාර්මික විද්‍යාලය	ලිපිනය	දුරකථන අංකය	දිස්ත්‍රික්කය
21	හෝමාගම කාර්මික විද්‍යාලය	ගොඩගම, හෝමාගම.	011-2855315 011-2857133	කොළඹ
22	කළුතර කාර්මික විද්‍යාලය	කලමුල්ල, කළුතර.	034-2227804 034-2222325 034-2236622	කළුතර
23	කෑගල්ල කාර්මික විද්‍යාලය	කච්චේරි පාර, කෑගල්ල.	035-2222441 035-2223319	කෑගල්ල
24	කුලියාපිටිය කාර්මික විද්‍යාලය	පන්නල පාර, කුලියාපිටිය.	037-2281181 037-2281323 037-2281271	කුරුණෑගල
25	මන්නාරම කාර්මික විද්‍යාලය	පන්නායිවෙඩ්ඩුවන් හන්දිය, මඩුපාර.	023-3238532	මන්නාරම
26	මාතලේ කාර්මික විද්‍යාලය	එම්.සී. පාර, මාතලේ.	066-2224196 066-2224847	මාතලේ
27	මාතර කාර්මික විද්‍යාලය	මැද්දවත්ත, මාතර.	041-2222565	මාතර
28	මැදගම කාර්මික විද්‍යාලය	බිබිලේ පාර, මැදගම.	055-2266113 055-2266213	මොණරාගල
29	මොණරාගල කාර්මික විද්‍යාලය	සිරිගල, මොණරාගල.	055-2276167 055-2277448	මොණරාගල
30	නුවරඑළිය කාර්මික විද්‍යාලය	ජයතිලක මාවත, නුවරඑළිය.	052-2222658 052-2235895	නුවරඑළිය
31	පාතදුම්බර කාර්මික විද්‍යාලය	නවයාලතැන්න, කටුගස්තොට.	081-2499782 081-2499024 081-2500441	මහනුවර
32	පොළොන්නරුව කාර්මික විද්‍යාලය	විද්‍යාපුර, පොළොන්නරුව.	027-2224429 027-2224428	පොළොන්නරුව
33	රත්මලාන කාර්මික විද්‍යාලය	ගාලුපාර, රත්මලාන.	011-2632778 011-2626955	කොළඹ
34	සම්මන්තුරේ කාර්මික විද්‍යාලය	අම්පාර පාර, සම්මන්තුරේ.	067-2260933 067-2051105 067-3133673	අම්පාර
35	ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය	මිහිඳුපුර, ත්‍රිකුණාමලය.	026-2223034 026-2051513 026-2227956	ත්‍රිකුණාමලය
36	වවුනියාව කාර්මික විද්‍යාලය	මන්නාරම පාර, නෙලුක්කුලම්, වවුනියාව.	024-2223664 024-2226720	වවුනියාව
37	වරකාපොල කාර්මික විද්‍යාලය	අහුරුවැල්ල පාර, වරකාපොල.	035-2267651 035-2268302	කෑගල්ල
38	වාරියපොල කාර්මික විද්‍යාලය	හලාවත පාර, වාරියපොල.	037-2267256	කුරුණෑගල
39	වීරවිල කාර්මික විද්‍යාලය	නව නගරය, වීරවිල.	047-2237064 047-2237032	හම්බන්තොට

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED